The Journal of Archaeology and Heritage Studies (JAHS) 9 (I) 2022: 32-40 pp

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page http://fssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# පැරණි රෝහණයේ දොළොස්දහස් රට මානාවුළුපුර ප්‍රාදේශීය රාජධානියේ මූලික ආරක්ෂක ක්‍රමෝපාය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්.ඒ. සම්පත් ප්‍රසන්න[1] සහ කේ.එම්. ඇලෙක්සැන්ඩර්[2]

[1] ස්ථානභාර නිලධාරී, මධ්‍යම සංස්කෘතික අරමුදල, රම්බා විහාර ව්‍යාපෘතිය. prasanna.sampath85@yahoo.com
[2] මහාචාර්ය, ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ.

**සංක්ෂිප්තය**

දකුණු ඉන්දියාවේ ප්‍රබල අධිරාජ්‍යන් ගොඩනැගෙන අවස්ථාවල එම පාලකයින් සිය බල පරාක්‍රමය පැතිරවීම පිළිබඳ අවස්තා ඉතිහාසය තුළ හමු වේ. එම තත්ත්වයට මුහුණ දෙන කලාපයක් වශයෙන් ශ්‍රී ලංකාව පෙන්වා දිය හැකි ය. පස්වන මිහිඳු රජුගේ (ක්‍රි.ව. 982-1029) පාලන සමයේ දී ද සොළී සේනාවක් මෙරට ආක්‍රමණය කර රජු ජීවග්‍රහයෙන් අල්වා ගැනීම උක්ත කී තත්ත්වයට නිදසුනක් වශයෙන් දැක්විය හැකි ය. එම රජු සොළීන් යටතට පත්වීමෙන් පසු ඇති වූ පවත්වාගෙන ගිය පීඩාකාරී පාලනයට එරෙහිව සාර්ථකව යුද කටයුතු මෙහෙය වීමට සමත් වූයේ පළමු වන විජයබාහු රජු බව ඉතිහාසයේ කියැවේ. ඔහු පැරණි රෝහණයේ "මානාවුළුපුර/මහානාගකුල" හෙවත් වර්තමාන රම්බා විහාර භූමිය කේන්ද්‍ර කරගනිමින් සිය යුද ශක්තිය වර්ධනය කරගත් බව ඉතිහාසයේ විස්තර හමු වේ. එහිදී ඔහුට සිය යුද ශක්තිය වර්ධනය කර ගැනීම කෙරෙහි දායක වූ ආරක්ෂක මධ්‍යස්ථානයේ ආරක්ෂක මූලික ක්‍රමෝපාය කවරාකාර වීද යන්න ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරනු ලබයි. ඒ අනුව හඳුනාගන්නා ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක දත්ත අනාවරණය මෙහි මූලික අරමුණ වන අතර විවිධ මානව ක්‍රියාකාරකම් නිසා දිනෙන් දින විනාශව යන පුරාවිද්‍යාත්මක තතු සමාජගත කිරීම මෙහි සෙසු අරමුණු අතර වේ. ඓතිහාසික තොරතුරු අධ්‍යයනය හා ක්ෂේත්‍ර ගවේෂණය මඟින් අනාවරණය කරගනු ලබන දත්ත මඟින් මෙහි පැරණි ස්වභාවය අර්ථකථනය කරනු ලබන අතර ගුවන් ඡායාරූප මඟින් ලබාගත් සාක්ෂි මෙහිලා ඉතා වැදගත් වීය. දීර්ඝ කාලයක සිට රජරට දේශපාලනික පසුබිම සකස් වීම සඳහා පැරණි රෝහණයේ දේශපාලනික භූමිකාව තීරණාත්මක සාධකයක් වූ බව මෙරට ඉතිහාසය අධ්‍යයනයේදී පැහැදිලි ය. විශේෂයෙන්ම වන දුර්ග, ගිරි දුර්ග, ජල දුර්ග හා පංක දුර්ග වැනි ආරක්ෂිත පරිසර මූලිකාංග කීපයක් මත සතුරු සේනාංකවලට රෝහණයට ළඟා වීම ඉතා දුෂ්කර කාර්යයක් වීම, රෝහණයේ පිහිටි ජල මූලාශ්‍රයෝ සහ පස යන ස්වභාවික සම්පත් කෘෂි ආර්ථිකය කෙරෙහි යහපත් දායකත්වයක් සැපයීම, දකුණු වෙරළ තීරය හේතුවෙන් ඇති වූ වෙළඳ ආර්ථිකය වැනි හේතු රෝහණය ස්වාධීනව වර්ධනය වීමට බලපා තිබේ. මෙම කරුණු සැළකිල්ලට ගනිමින් ආරක්ෂක ක්‍රමෝපායන් සකස් කරවමින් සිය ආරක්ෂාව තහවුරු කර ගන්නා ආකාරය පළමු වන විජයබාහු රජු හා පසුකාලීන පාලකයින් වළවේ ගඟ අසල පවත්වාගෙන ගොස් ඇති මෙම මානාවුළුපුර පාලන මධ්‍යස්ථානයේ පැරණි අමුණු, ඇළ මාර්ග ඊට සාක්ෂි දරයි.

**මුඛ්‍ය පදඃ** මානාවුළුපුර, උඳුන්දොර, රෝහණ රාජධානිය, අමුණ, අටදහස් රට, දොළොස්දහස් රට

ARTICLE INFO

*Article history:*
Received 10 February 2023
Accepted 17 October 2023
Available online 29 December 2023

## 1. හැඳින්වීම

ඓතිහාසික රෝහණ රාජධානියේ ව්‍යාප්ත ව පැවති භූ විවිධත්වය නිසා අතීතයේ සිට ම දේශපාලනික, ආර්ථික, සාමාජයීය හා ආගමික කාරණා වලදී කියැවේ. විශේෂයෙන්ම දේශපාලනික වශයෙන් රෝහණ රාජධානිය ආරක්ෂිත භූමියක් ලෙස වැදගත්වීම කෙරෙහි දුර්ගමය ආරක්ෂිත පද්ධතිය පදනම් විය. එය රෝහණය ආරක්ෂක භූමියක් වීමට සෘජුව ම බලපෑ ආකාරය හඳුනාගත හැකි ය. රෝහණය භූගෝලීය වශයෙන්



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk


රජරට රාජධානියෙන් වෙන්ව පිහිටියා වූ ආරක්ෂිත භූමි භාගයක් බවට පත්ව තිබූ බව ඓතිහාසික තොරතුරු හමු වේ (නිකලස්, 2001, 13). විශේෂයෙන්ම සතුරු සේනාංකවලට රෝහණයට ළඟා වීම ඉතා දුෂ්කර කාර්යයක් වීම, රෝහණයේ පිහිටි ජල මූලාශ්‍ර සහ පස යන ස්වභාවික සම්පත් කෘෂි ආර්ථිකය කෙරෙහි යහපත් දායකත්වයක් සැපයීම, දකුණු මුහුදු තීරය ඔස්සේ ක්‍රියාත්මක වූ මුහුදු සේද මාවත හා සම්බන්ධ වෙළඳ කටයුතු වැනි හේතු රෝහණය ස්වාධීනව වර්ධනය වීමට බලපා තිබේ. දීර්ඝ කාලයක සිට රජරට දේශපාලනික සම්ප්‍රදායට සමගාමීව රෝහණයේ දේශපාලනික භූමිකාව තීරණාත්මක සාධකයක් වීම, රෝහණයේ පිහිටි ස්වභාවික වරායන් හා බැඳුණු විදේශීය වෙළෙඳාම, ආර්ථික ශක්තිය නංවාලීමට සමත් ස්වභාවික සම්පත්වල පිහිටීම, යුද ශක්තිය වර්ධනයට අවශ්‍ය වූ ලෝහ නිෂ්පාදනට අවශ්‍ය 'යපස් නිධි' බහුලවීම, යුද ශක්තියෙන් පිරි රටේ ආරක්‍ෂාව සඳහා කැප වූ මානව සම්පත්වලින් යුක්ත වීම ද ආරක්ෂිත භූ ඒකකයක් වශයෙන් ඉස්මතු වීමට බලපා ඇත.

දකුණු ඉන්දියාවේ ප්‍රබල අධිරාජ්‍යන් ගොඩනැගෙන අවස්ථාවල ලංකාවට එරෙහිව ආක්‍රමණ එල්ල වීම සාමාන්‍යයෙන් සිදු වන බව මෙරට රාජධානි ඉතිහාසය අධ්‍යයනයේ දී පැහැදිලි ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සොළී සේනාවක් මෙරට ආක්‍රමණය කරනු ලබන අතර පස්වන මිහිඳු රජු (ක්‍රි.ව. 982-1029) ජීවග්‍රහයෙන් අල්වා ගැනීම ද සිදු විය. එහිදී ගෙන ගිය සොළී පාලනයට එරෙහිව සාර්ථකව යුද කටයුතු මෙහෙය වීමට සමත් වූ පළමු වන විජයබාහු රජුගේ මුල් ආරක්ෂක මධ්‍යස්ථානය වූයේ ඓතිහාසික මානාවුළුපුරයයි. පළමු වන විජයබාහු රජුගෙන් පසුව මෙරට සමස්ථ දේශපාලනයේ යම් යම් වියවුල්කාරී තත්ත්වයන් ඇති වේ. ඒ අනුව රෝහණ රාජ්‍යයේ දොළොස්දහස් රට පැවති මානාවුළුපුර මධ්‍යස්ථානයට අමතරව අටදහස් රට උඳුන්දොර රාජධානිය ද ඉස්මතු වන අතර අපගේ අධ්‍යයනයට අදාළ ආරක්ෂක මධ්‍යස්ථාන ද්විත්වය එකවර බලපැවැත්වීම සිදු වන්නේ පළමු වන විජයබාහු රජුගෙන් පසුව බව කිව යුතු ය. රෝහණය රාජ්‍යය අටදහස් රට හා දොළොස්දහස් රට වළවේ ගංගාව මඟින් වෙන් කර, අටදහස් රට සිරිවල්ලභත්, දොළොස්දහස් රට කිත්සිරිමේඝත් පාලනය ආරම්භ කරයි. ඒ ආකාරයට ආරම්භව පැවත ආ මෙම ආරක්ෂක මධ්‍යස්ථාන අතුරින් දොළොස්දහස් රට මානාවුළුපුර රාජධානියේ ආරක්ෂක ක්‍රමෝපායක් ගැන ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක දත්ත ඇසුරින් ඉදිරිපත් කරනු ලබයි. ඒ අනුව ප්‍රබල ඉන්දීය සොළී පාලනයට එරෙහිව නැගී සිටීමට තරම් බලයක් ගොඩනගා ගැනීමට සමත් මූලික ආරක්ෂක පසුබිමක් කවර අයුරින් සකස් කළේද යන්න මෙම පර්යේෂණයේ ගැටළුව වශයෙන් දැක්විය හැකි ය.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ, ඓතිහාසික මූලාශ්‍රයන්හි එන මානාවුළුපුර පරිපාලන මධ්‍යස්ථානයේ මූලික ආරක්ෂක ක්‍රමෝපාය හඳුනා ගැනීමයි. එය මූලික කර ගනිමින්, පුරාණ රෝහණ රාජධානියේ ජනතාවගේ දේශපාලන භූමිකාව හා පසුබිම ගොඩනැගුණු අයුරු පරීක්ෂා කිරීම මෙහි අරමුණු අතර වේ. තවද අනවසර හා වෙනත් මානව ක්‍රියාකාරකම් හේතු කොට ගෙන බොහෝ පුරාවිද්‍යාත්මක අවශේෂ පර්යේෂකයන්ගේ අවධානයට යොමු නොවී විනාශයට ලක් වෙමින් පවතී. එබැවින් අතීත මානව යටගියාව අනාවරණය සඳහා වැදගත් වන පුරාවිද්‍යාත්මක සාක්ෂි අනාවරණය කර ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ තවත අරමුණක් වශයෙන් දැක්විය හැකි ය. ඒ අනුව යමින් රෝහණයේ මානාවුළුපුර වශයෙන් ආරක්ෂක මධ්‍යස්ථානයක් බිහිවීමට අදාළ පිළිබඳ පසුබිම හඳුනා ගැනීමත්, ආරක්ෂක ක්‍රමෝපාය අර්ථකථනය කරමින් එකළ දේශපාලනික හා සමාජ විද්‍යාත්මක පසුබිම විග්‍රහ කිරීමට වැදගත් දිනෙන් දින විනාශ වන පුරාවිද්‍යාත්මක සාක්ෂි වාර්තා කර විග්‍රහ කිරීම මඟින් නිරවද්‍ය ඉතිහාසයක් වැළලීමේ අවදානමින් මුදවා ගැනීමත් මෙම පර්යේෂණයේ වැදගත්කම් වශයෙන් පෙන්වා දිය හැකි ය.

ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය කිරීමේදී මෙම ස්ථානයට අදාළව විවිධ විද්වතුන් දැක්වූ අදහස් හා වාර්තා හඳුනාගත හැකි විය. ආර්.එල්. බ්‍රෝහියර්ගේ "ලක්දිව පුරාතන වාරිමාර්ග" යන කෘතීන් මෙහි දී අධ්‍යයනයෙහිලා ඉවහල් කරගත හැකි කෘති වශයෙන් වැදගත් වෙයි. ඓතිහාසික යුගයෙන් පසුව කලක් වන ගතව පැවති මානාවුළුපුර පිළිබඳ මෑත ඉතිහාසයේ විවිධ පර්යේෂකයින් විසින් ස්ථානීය තොරතුරු ඉදිරිපත් කර ඇත. ඒ *Royal Asiatic Society of Sri Lanka (RASSL)* හි පළ කළ *"NOTES ON CEYLON TOPOGRAPHY IN THE TWELFTH CENTURY"* පත්‍රිකාවේ කොඩ්රිංටන් පැරණි රම්බා විහාරය

(මානාවුළුපුර) හා ඒ ආශ්‍රිත නටබුන් පිළිබඳ විස්තර කර ඇත. පසුකාලීනව මෙම ප්‍රදේශයේ නිරික්ෂණයක යෙදෙන සී.ඩබ්. නිකලස් විසින් *"HISTORICAL TOPOGRAPHY OF ANCIENT MEDIEVAL CEYLON"* නැමති ලිපිය මගින් *Royal Asiatic Society of Sri Lanka (RASSL)* ග්‍රන්ථයේ විස්තර කරයි.





**සිතියම 01. රෝහණ රාජ්‍යය තුළ අටදහස් රට හා දොළොස්දහස් රට පිහිටි අයුරු**

රුහුණේ අම්බලන්තොට හා මාමඩල ආශ්‍රිත ප්‍රදේශයේ වාරිමාර්ග කටයුතු සිදුකළ ආර්.එල්. බ්‍රොහියර් විසින් රම්බා විහාරය ආශ්‍රිත ප්‍රදේශය පිළිබඳ *Ancient Irrigation Works in Ceylon* කෘතියේ විස්තර කර ඇත.


සෙනරත් පරණවිතාන ද මෙම ස්ථානය රම්බා විහාරය වශයෙන් හඳුනා ගෙන ඇත (Paranavitana, 1955). වික්‍රමසූරිය විසින් "*රුහුණු රට පුරාණ රාජධානිය*" නම් ග්‍රන්ථයෙහි රම්බා විහාරයට (මානාවුළුපුර) බටහිරින් ගලා බසින මාමඬල ඇළ මාර්ගය අතීතයේ ද කොස් වතු ආර නමින් හඳුන්වා ඇත.

යම් භූමියක පවත්නා රජයක ශක්තිමත්භාවය රඳා පවතින මූල සාධකය ලෙස එම භූමියේ පවත්නා උපයෝගීතාවය වැදගත් වේ. රාජ්‍යයක ශක්තිමත් බව මෙන් ම දුර්වල බව උදෙසා හේතුවන ප්‍රධාන සාධකයක් ලෙස එම භූමියේ පිහිටි සම්පත්වල ස්වභාවය ද බලපානු ලබයි. භූමියක හෝ රාජ්‍යයක දේශපාලනය තීරණය කිරීම සඳහා අතිශය තීරණාත්මක වන කරුණු කිහිපයක් මෙහි දී අපට ගෙනහැර දැක්විය හැකි ය. ඒ අතර භූමියේ පිහිටි ස්වාභාවික සම්පත්වල ප්‍රමාණය, කෘෂිකර්මාන්තය සඳහා උචිත භූමි ප්‍රදේශ හා ජනාවාසකරණ සිදු වී ඇති භූමි ප්‍රමාණය ඒ අතර වැදගත් වේ. එමෙන්ම පිරිසිදු ජලය, ස්වාභාවික වනාන්තර ප්‍රතිශතය හා භූමියේ ආරක්ෂිත ස්වභාවය ඊට නොදෙවනි වේ. තවද වාණිජ කර්මාන්ත සඳහා උපයෝගීවන සාධක හා ප්‍රවාහනය හා ගමනාගමනය කෙරෙහි ඇති උපයෝගීතා යනාදී සාධකවල ප්‍රබලත්වය මත භූමියකින් උපදින දේශපාලනයේ ස්වභාවය තීරණය වේ. ඒ අනුව දේශපාලනය සඳහා ද භූමිය මගින් සුවිශාල කාර්යභාරයක් ඉටු කෙරෙන බව පැහැදිලි ය. එනම්, අගනගර බිහිකර ගැනීමට භූමි තෝරා ගැනීම හෝ ආරක්ෂක මධ්‍යස්ථානවලට උචිත භූමි තෝරා ගැනීම අනුව යම්කිසි රාජ්‍යයක ශක්තිමත්භාවය තීරණය කිරීමට මෙන් ම එම රාජ්‍යයේ පැවැත්ම කෙරෙහි ද බලපානු ඇත.





**රූප සටහන 01. ජල දුර්ගයක් නිර්මාණය කර ඒ මධ්‍යයේ ගොඩනැගුණු මානාවුළුපුර රාජධානිය**



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk





රූප සටහන 02. ගංගාවේ තෝරාගත් ස්ථාන ඉහළින් පෙනෙන අයුරු





රූප සටහන 03. ගංගාවේ තෝරාගත් ස්ථානයේ පැතිකඩ




රූප සටහන 04. ගංගාවේ තෝරාගත් ස්ථානය විශාල ගල් කුට්ටි තබා හරස් කිරීම (පැතිකඩ පෙනුම)




රූප සටහන 05. ගංගාවේ ජල පහර අඩාල වීම (පැතිකඩ පෙනුම)



ඡායාරූපය 01. ගංගාව හරස් කරන ලද ස්ථානයේ දූනට හඳුනාගත හැකි විශාල ගල් කුට්ටි

ආරක්ෂක වශයෙන් ශක්තිමත් වීමට ද, ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට හා සමෘද්ධිමත් වීමට ද සුදුසු භූගෝලීය ඒකකවල අගනගර ඉදි වූ අයුරු ලංකා ඉතිහාසය පුරාවට දූකගත හැකි ය. විවිධ දේශපාලන හා සතුරු ආක්‍රමණ නිසා රාජධානි නිරිතදිග ආරක්ෂිත ප්‍රදේශවලට විටින් විට සංක්‍රමණය වන්නේ රජවරු දේශපාලනය සඳහා උචිත භූමි තෝරා ගැනීම නිසා ය. එමෙන් ම රජරට සභ්‍යත්වයේ අර්බුදකාරී දේශපාලන වාතාවරණය තුළ ආරක්ෂක රාජධානිය ලෙස රෝහණය කැපී පෙනුණි. භූමිය උදෙසා දේශපාලනය සිදු වූ අන්දම ඉතිහාසය පුරාවටම හඳුනාගත හැකි ය. රාජ්‍යයක බලය වර්ධනය වන්නේ එය සතු භූමි ප්‍රදේශ අනුව ය. රාජ්‍යයක භූමිය ප්‍රසාරණය වන විට එහි රාජ්‍ය බලය ද ප්‍රසාරණය වේ.

## 2. ක්‍රමවේදය


පර්යේෂණයේ පළමු අදියරේ දී, ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය කරනු ලැබිණ. එහිදී විෂය ක්ෂේත්‍රයට අදාළ පූර්ව පර්යේෂණයන්ට අනුව යමින් පැරණි මානාවුළුපුරට අයත් ස්ථානයන්හි සිදු කළ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු ඔස්සේ දත්ත රාශියක් අනාවරණය කරනු ලැබිණ. එහිදී විධිමත්ව දත්ත රැස්කර ගැනීමත්, අධ්‍යයන ප්‍රදේශයට අයත් පුරාවිද්‍යාත්මක පරිශ්‍ර වාර්තා කිරීම හා සිතියම් ගත කිරීමත් සිදු විය. ප්‍රදේශයේ පවත්නා ජනප්‍රවාද ද මෙම ස්ථාන අනාවරණය කර ගැනීමේ දී වඩාත් දායක කරගත් බව කිවයුතු ය. එම ක්‍රමවේද අනුගමනය කර, පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික මූලාශ්‍ර පරිශීලනයෙන් ලබාගත් දත්ත අනුසාරයෙන් මානාවුළුපුර ආරක්ෂක මධ්‍යස්ථාන පිළිබඳ ව විමර්ශනය සිදු කරනු ලැබී ය.

## 3. ප්‍රතිඵල


### 3.1. මානාවුළුපුර (මහානාගහුල/රම්බා විහාර) ආරක්ෂිත මධ්‍යස්ථානය ගොඩනගා තිබූ ආකාරය

වළවේ ගංගාවෙන් හා මාමඩල ඇළෙන් සීමා මායිම් වන පරිදි සකස් වූ මෙම භූමියේ බලකොටුවකට අවශ්‍ය ආරක්ෂාව සඳහා ජල දුර්ගයක් මඟින් තහවුරු කර ගන්නා ආකාරය හමුවන පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව පැහැදිලි ය (රූප සටහන 01). විශේෂයෙන්ම මේ දුර්ගය සකස් කිරීම සඳහා ගඟ හරහා නිර්මාණය වී තිබෙන පාෂාණ තීරු මැනවින් යොදා ගනු දකිය හැකි ය.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



**ඡායාරූපය 02. ගංගාව හරස් කරන ලද ස්ථානයේ දැනට හඳුනාගත හැකි විශාල ගල් කුට්ටි**





**රූප සටහන 06. ගංගා ජල පහර බාධා කර ඇළ මාර්ගය ඉදි කිරීම**




**ඡායාරූපය 03. පැරණි මාමඩල ඇළ මාර්ගයේ සාක්ෂි**

තවද වළවේ ගංගාවේ ජල පහරෙහි වේගය අඩාල කිරීමට සමත්, ඊට වඩාත් උචිතම ස්වරූපයෙන් සකස්ව තිබෙන පාෂාණ තීරු තෝරා ගෙන තිබීමත් ජල මාර්ගයේ ගැඹුර ආරක්ෂා කිරීමට ගත් උපක්‍රමත් මෙකළ පැවති ජල කළමණාකරන දැනුම පෙන්නුම් කරනු ලබයි. එම ක්‍රියාවලියට අදාළ රූප සටහන් හා ඡායාරූප මේ සමඟ ඉදිරිපත් කරනු ලබන අතර එමගින් මෙහි පැවති අතීත ස්වරූපය පැහැදිලි කරගත හැකි ය (රූප සටහන් 02-10, ඡායාරූප 01-05).

මෙම ආරක්ෂක මධ්‍යස්ථානය ගොඩනැගීමේ පළමු පියවර වනුයේ වළවේ ගඟ හරස් කිරීමට සුදුසු ස්ථානය තෝරා ගැනීම බවට විශ්වාස කළ හැකි ය (රූප සටහන් 02-03). දෙවනුව ගඟ පත්ලේ ඇති සැඩ ජල පහරට ඔරොත්තු දෙන  පාෂාණ වැටිය මත විශාල ගල් කුට්ටි යෙදීම සිදු කර ඇත (රූප සටහන් 04-06, ඡායාරූප 01-02). ඒ ආකාරයට ජල මාර්ගය හරවා ඇළ මාර්ගය තනා තිබේ (රූප සටහන 06). එලෙස ගඟෙහි ජලය හරස් කර ගල් වැටිය (බාධක වැටිය යොදා ඇළ මාර්ගය සකස් කිරීමේ දී) යෙදීමෙන් පසු ඒකාකාරීව ගලා බසින ලද ජල දහරාවේ උස අඩු වී ගල් වැටියට ආසන්න ප්‍රදේශයේ ගඟ හරහා පයින් ගමන් කිරීමට හැකි පරිදි සකස් වන්නට ඇත. ඊට ඒ අශ්‍රිත භූ විෂමතාවය හේතු වූ බව කිව හැකි ය. ඊට විසඳුමක් වශයෙන් ශක්තිමත් අමුණක් සකස් කළ බව පෙනෙන්නට තිබේ (රූප සටහන් 07-10, ඡායාරූප 04-05). ඊට පිළියමක් ලෙස බාධක වැටියට පහළින් ඇති හුණුගල් තීරුව පදනම කර ගනිමින් තවත් බැම්මක් ඉදිකර තිබූ බවට සාක්ෂි හඳුනාගත හැකි විය. එමඟින් භූමියේ ආරක්ෂාවත්, මෙහි වාසය කළ අයට ජල පහසුව ලබා ගැනීමටත් සුදුසු පරිදි නිර්මාණය කර තිබූ බවට නිගමනය කළ හැකි ය.




**රූප සටහන 07. ගංගාවේ ජල පහර අඩාල වීම (පැතිකඩ පෙනුම)**




**රූප සටහන 08. තවත් බැම්මක් ඉදිකර සතුරන්ට ඇතුළුවිය නොහැකි අයුරින් ජලයේ ගැඹුර වැඩි කිරීම**


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk



ඡායාරූපය 04. හුණුගල් තීරුව මත කළ පැරණි අමුණෙහි පාදම් සළකුණු

රම්බා විහාර භූමියේ සිතියම පරීක්ෂා කිරීමේ දී අමුණට පැවති බවට සාක්ෂි හමුවන ස්ථානයට ආසන්නව ස්මාරක සංකීර්ණයක (අංක 03 වශයෙන් හඳුන්වන) මෙම භූමියේ වෙනත් ස්මාරක වල හමු නොවන ආකාරයේ ගලින් කළ බැම්මක් හා විශාල ප්‍රමාණයේ කවාකාර පිළිස්සූ මැටි කොටස් හමු වේ (ඡායාරූපය 05). මේවා පහසුවෙන් බැමි මත තැබිය හැකි ආකාරයට නිමවා තිබීම විශේෂත්වයකි. එමෙන්ම විවිධ ප්‍රමාණයේ පාෂාණ කොටස් හමු වීම හා එහි ස්වභාවය අනුව ද්විතීක නිර්මාණයක් බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. ඒ අනුව නිසැකවම විනාශ වූ අමුණේ කොටස් ගෙනැවිත් පසු අවධියේදී මෙම ශිලා ප්‍රාකාරය කරවූ බවට නිගමනය කළ හැකි ය.

## 4. සාකච්ඡාව

මෙම ආරක්ෂක මධ්‍යස්ථානය පැවති භූමි භාගය වත්මන්හි ඓතිහාසික රම්බා විහාර පුරාවිද්‍යා පරිශ්‍රය වශයෙන් හඳුන්වයි. ඓතිහාසික යුගයෙන් පසුව කලක් වන ගතව පැවති රම්බා විහාරය පිළිබඳ මෑත ඉතිහාසයේ විවිධ පර්යේෂකයින් විසින් ස්ථානීය තොරතුරු ඉදිරිපත් කර ඇත (Codrington, 1922, 62-74; Nicholas 1963, 69; Brohier, 1937; Paranavitana, 1955). අක්කර 250ක් පමණ වූ භූමි භාගයකට අයත් මෙම කලාපය 2001.05.04 දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රය මඟින් සීමා මායිම් ඉදිරිපත් කරයි. ඒ අනුව "දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, උඩරොට සහ පල්ලරොට ගම්වලට අයත්, උතුරට වලවේ ගඟටත්, දකුණට සහ බටහිරට මාමඩල ඇළටත්, නැගෙනහිරට වැලි පාරටත්, සීමාවන බිම් ප්‍රදේශයේ පිහිටි ස්මාරක..." යනුවෙන් නම් කර තිබෙනු දැකිය හැකි ය. වර්තමානයේ ඉපැරණි අවධියේ සාක්ෂි පෙන්නුම් කෙරෙන, පුරාවිද්‍යාත්මක කැණීම් හා සංරක්ෂණ මඟින් ඉස්මතු කරනු ලැබූ ස්මාරක රැසක් දැකගත හැකි ය. බලකොටුවක් වශයෙන් ජල දුර්ගයකින් ආරක්ෂාව සලසාගෙන තිබීම හේතුවෙන් රජයේ ගැසට් පත්‍රයේ දක්වා ඇති වැලි පාර නම් සීමාව ඉක්මවා මෙහි ව්‍යාප්තිය සිදු වන්නට ඇති බව පැහැදිලි ය. වැලි පාර යනු කිසිසේත්ම ඉපැරණි රාජධානියක භූ ගෝලීය සීමාවක් විය නොහැකි ය. විශේෂයෙන්ම සිතියම් මඟින් පරීක්ෂා කිරීමේදී පෙර රජදවස කියැවෙන යුදමය වශයෙන් ආරක්ෂිත භූමි භාගයක් බව මනාව පැහැදිලි වේ. උතුරින් පිහිටි වලවේ ගංගාවෙන්ම ආරම්භ වන මාමඩල ඇළ විටෙක දී ගඟට දුරස්ව ගලා ගොස් නැවත ගඟට ආසන්නව ගලා බසියි.

වර්තමානයේ මාමඩල ඇළ ලියන්ගස්තොට අමුණින් ආරම්භ වූවද අතීතයේ මෙම භූමි කලාපයට ඉතා ආසන්නව වයඹ දිශානුගතව පිහිටි ස්ථානයකින් ආරම්භ කළ බවට තොරතුරු ඇත. ඒ සඳහා නිර්මාණය කළ අමුණක් මඟින් ජල දුර්ගයකට මැදි වන බලකොටුවකට උචිත භූමි ඒකකයක් නිර්මාණය කළ බවට සාක්ෂි හමු වේ. විශේෂයෙන් ම ජල මාර්ගය හරස් කර නිර්මාණය කළ අමුණ, ගඟ තරණය සඳහා පාලමක් වශයෙන් ද භාවිතයට ගන්නට ඇතැයි නිගමනය කළ හැකි ය. මෙම අමුණ ඉදි කිරීම සඳහා ගංගාව හරහා නිර්මාණය වී තිබෙන හුණුගල් තීරුව යොදා ගෙන තිබේ. වර්තමානයේ ගඟේ ජල මට්ටම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අඩු වූ විට මනාව නිරීක්ෂණය කළ හැකි චතුරස්‍රාකාර වළවල් මෙහි පදනම දැමීම සඳහා යොදා ගත් බවට විශ්වාස කළ හැකි ය. මෙම හුණුගල් තීරුව පැරැන්නන් "සුදු හුණු ගල්පල්ල" යනුවෙන් හඳුන්වා ඇත. "රුහුණු රට පුරාණ රාජධානිය" නම් ග්‍රන්ථයෙහි රම්බා විහාරයට බටහිරින් ගලා බසින මාමඩල ඇළ මාර්ගය අතීතයේ ද කොස් වතු ආර නමින් හඳුන්වා ඇත (වික්‍රමසූරිය, 1926). මහ විජයබාහු රජු කෘෂිකර්මාන්තය නැංවීම සඳහා "සුදු හුණු ගල්පල්ල" නමින් හැඳින්වෙන මෙම ස්ථානයෙන් වලවේ ගඟ හරස් කොට බැඳ ජලය මාමඩල වැව දක්වා ගෙන ගොස් ඇති බව ද කියයි. එම ඇළ මාර්ගය නිර්මාණය අනුව රාජධානියේ නැගෙනහිර සීමාව සුළු කොටසක් පමණක් ජලයෙන් මායිම සලකුණු නොවන බව පෙනෙන්නට ඇත.

නමුත් වසර ගණනාවකට පෙර තිබූ තත්ත්වය හඳුනා ගැනීම සඳහා තවදුරටත් පර්යේෂණ කළ යුතුව ඇත. නමුත් මානව ක්‍රියාකාරකම් නිසා එම සාක්ෂි අහිමිව ගොස් ඇත. රාජධානියේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා ජල දුර්ගය භාවිතයේ දී වලවේ ගඟට වඩාත් ආසන්නව වී ගලා බසින සීමාව රැකවල් කිරීමෙන් මෙහි ආරක්ෂාව තහවුරු කර ගන්නට ඇති බව පවතින භූ ලක්ෂණ පරීක්ෂා කිරීමේදී පැහැදිලි ය. එනම් රාජධානියේ නැගෙනහිර සීමාව වැලි පාර ද ඉක්මවා යන බව පෙනෙනන්ට ඇත.

එකළ බලකොටුවක අභ්‍යන්තර සීමාව පැවති ආරක්ෂක ක්‍රමෝපායන් ගැන අදහසක් ලබා ගැනීමට මහාවංසයේ සඳහන් බලකොටු තැනීම හා ආරක්ෂක උපක්‍රම සම්බන්ධ විස්තර ඉවහල් කරගත හැකිය. නිදසුනක් වශයෙන්,

> *"ඇතුන් විසිනිදු සෙල්විය නොහැකි වූ හින්දි පලාශ්‍රයෙන් සමාන වූ කණු එකිනෙකට සම්බන්ධ කොට බිම කැණ සිටුවා ඉන් බැහැර ප්‍රමාණයෙන් ඊට අධික වූ යෂ්ටි වෙෂ්ටනයෙන් වෙළන ලද්දා වූ මහකණු සිදුරු රහිත කොට සිටුවා යළිත් ඒ කණු (දෙවැට) මැද හාත්පස විසිතිස් රියන් පුළුල්වූ ශතපුරුෂ ප්‍රමාණ ඇළ කණවා, එහි තියුණු උල් හා කටු අතුට ඉන් බැහැර පෙදෙස ශූලපාදයන් සිටුවා ඒ හා බඩ සිදුරු රහිත වූ කටුවැට කොට ඒ මැද පෙර පරිද්දෙන් අගල කණවා එහිදු හුල් පාගා කටු අතුරුවා වැටෙන් පිට ද ජාලාන්ත කොට අගල කණවා එහිද තියුණු උල් හා කටු අතුට ඇළෙන් පිටත ශරපාන දෙකක් තුනක් පමණ තැන එකහෙළා මහවනය සිඳුවා ඉන් පිට චෞර මාර්ගයන්හි මහා ආවාටයන් කැණ එහි අතුරු නැති සේ තියුණු කටු අතුට ඒ ආවාටයන් හාත්පස වැලි හා පුරාණ පණීයෙන් වස්වා බලන්නන්ට යා යුතුවූ මාගී සමාන කරවා ඒ මග පැමිණි පසමිතුරු සෙන් නිරවශේෂ කොට සන්වනු පිණිස හාත්පස සොරමං කරවා ඒ මාගීයන්හි තීක්‍ෂණවේධී වූ ධනුර්ධරයන් යොදවා දුගීය මැද සිටු මහල් පහයක් කරවා ඒ මතුයෙහි ඒ ඒ තන්හි ධනුර්ධරයන් යොදවා"*

යනාදී වශයෙන් මහාවංසයෙහි එන සඳහන දැක්විය හැකි ය (මව. 72: 267-280). අටදහස් රට ආරක්ෂක මධ්‍යස්ථාන ගොඩනැංවීමේදී ක්‍රියාකළ ආකාරය මහාවංසයේ විස්තර කර ඇත. එනම්,


> *"සියලු දුර්ගස්ථානයන්හි රට සීමාව දක්වා ඇතුන් විසිනුදු කම්පාකට නොහැකි බොහෝ බලකොටු කොට ගෙණ ඊ වටා අගල් බිඳුවා එහි යකටු බඳු වූ තියුණු කටු අතුරවා"*

යනුවෙන් රැකවල් හා ආරක්ෂක ක්‍රම යෙදූ බවයි (මව. 74: 34-35). මානාවුළුපුර ද එවැනි උපක්‍රම අනුගමනය කරන්නට ඇති බවට නිගමනය කළ හැකි ය.


## 5. සමාලෝචනය

ජල දුර්ගයක් මඟින් මූලික ආරක්ෂාව සපයා ගනිමින් පළමු වන විජයබාහු රජු (ක්‍රි.ව. 1055-1110) පාලන මධ්‍යස්ථානය කර ගත් මහානාගහුල නම් ස්ථානය ඉතිහාසයේ අවස්ථා ගණනාවකදී කියැවේ. විශේෂයෙන්ම යුද වාතාවරණය පහව ගිය අවස්ථාවල බෞද්ධ භික්ෂූන්ගේ පාලනයේ පැවති ආගමික මධ්‍යස්ථානයක් වශයෙන් ද මෙම ස්ථානය ප්‍රකට ය. ආරක්ෂිතව සිටිමින් වලවේ ගංගාවේ ජලය යොදාගෙන ආසන්න තැනිතලා ප්‍රදේශයේ ගොවිතැන් කරමින් පාලකයින් යුද කටයුතු සඳහා අවශ්‍ය ආහාර නිෂ්පාදනය කරන්නට ඇත. තවද මෙම ප්‍රදේශයට නුදුරු රම්මල් කඳු වැටියේ හමුවන ලෝහ නිස්සාරණ තොරතුරු අනුව, රාජධානිය සඳහා අවශ්‍ය අවි ආයුධ



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*




රූප සටහන 09. පැරණි අමුණේ පාදම් වලවල්වල පිහිටීම අනුව එහි තාක්ෂණය උපකල්පනය කර රූපයට නැගූ බැම්




ඡායාරූපය 05. රම්බා විහාර පුරාවිද්‍යා පරිශ්‍රය තුළ හමුවන ගල් බැම්ම හා ඒ අසල හමු වූ මැටි කොටස්



රූප සටහන 10. පැරණි අමුණේ පාදම් වලවල්වල පිහිටීම අනුව උපකල්පනය කර රූපයට නැගූ අමුණක චිත්‍රයක්

එහි නිෂ්පාදනය කළ බව පැහැදිලි ය. රෝහණයේ පිහිටි ස්වභාවික වරායන් හා බැඳුණු විදේශීය වෙළෙඳාම, ආර්ථික ශක්තිය නංවාලීමට සමත් ස්වභාවික සම්පත්වල සුලභතාවය, යුද ශක්තිය වර්ධනයට අවශ්‍ය ස්වභාවික පිහිටීම, අවි ආයුධ නිෂ්පාදනයට අවශ්‍ය ලෝහ නිස්සාරණයට වැදගත් වන 'යපස් නිධි' බහුලවීම, යුද නිපුණත්වයෙන් යුතු ආරක්ෂාව සඳහා කැප වූ මානව සම්පත්වලින් සමන්විත වීම යනාදිය ද විශේෂිත භූ ඒකකයක් වශයෙන් ඉස්මතු වීමට බලපා ඇති බව කිව හැකි ය. ඒ අනුව පැරණි රෝහණයේ ගොඩනැගුණු ස්වාධීන පරිපාලන මධ්‍යස්ථානයක් වූ " මානාවුළුපුර/මහානාගකුල"ට අමතරව "උඳුන්දොර රාජධානිය" හෙවත් වර්තමාන "ගලබැද්ද" නම් ස්ථානය ද වර්ධනය වේ. රෝහණ රාජ්‍යය වළවේ ගංගාව මඟින් වෙන්ව "උඳුන්දොර" රාජධානිය අටදහස් රට පරිපාලන මධ්‍යස්ථානය වශයෙනුත් "මානාවුළුපුර" දොළොස්දහස් රට පාලන මධ්‍යස්ථානය වශයෙනුත් බිහි ව තිබේ.

## 6. ආශ්‍රිත ග්‍රන්ථ


- අභයවර්ධන, එච්. ඒ. පී., 1978. ***කඩයිම් පොත් විමර්ශනය.*** කොළඹ: සංස්කෘතික දෙපාර්තමේන්තුව.



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

- ඇඳගම, එම්., 1991. *"ඌවේ ඉතිහාසය"* ***ඌව වංශ කථාව*** (1 කාණ්ඩය), බණ්ඩාර, තිලකසිරි., (සංස්). බදුල්ල : ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.
- ***ඌව විහාර වංශය,*** 1997. (සංස්)ඃ බණ්ඩාර, තිලකසිරි, ඌව පළාත් සභා සංස්කෘතික අමාත්‍යාංශය.
- එල්ලාවල, එච්., 2000. ***පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.*** කොළඹඃ සංස්කෘතික දෙපාර්තමේන්තුව.
- එල්ලාවල, එච්., 1967. **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය.** කොළඹඃ සංස්කෘතික දෙපාර්තමේන්තුව.
- ගුණසිංහ, පී. ඒ. ටී., 1968. ***පුරාතන රෝහණ රාජ්‍යය.*** **නුගේගොඩඃ** දීපානි මුද්‍රණ ශිල්පීන් සහ ප්‍රකාශකයෝ.
- චන්ද්‍රරත්න, ආර්. එම්. එම්., 2012. *"සාමාජීය විකාශය"* ***ශ්‍රී ලාංකේය ඉතිහාසය.*** 1 වෙළුම, ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග (ප්‍ර. සංස්). ඩබ්ලිව්. ඉන්ද්‍රකීර්ති සිරිවීර, චන්දන රෝහණ විතානාච්චි, ආරිය ලගමුව/ ඩී. තුසිත මැන්දිස්, සිරිමල් රණවැල්ල, හඟුරන්කෙත ධීරානන්ද හිමි, බී.ඒ. ටෙනිසන් පෙරේරා, සිරි තිලකසිරි, පී.එල්. ප්‍රේමතිලක, සේනක බණ්ඩාරණායක., (සංස්). කැලණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
- නිකලස්, සී. ඩබ්ලිව්., 2015. *"I වන විජයබාහුගේ රාජ්‍යය කාලය"* ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** I කාණ්ඩය, II භාගය, හේම් චන්ද්‍ර රාය, එන්. ආටිගල, ඩබ්ලිව්. ජේ. එෆ්. ලබ්රෝයි, එස්. නටේසන්, සී. ඩබ්ලිව්. නිකලස්, එස්. පරණවිතාන., (සංස්). කැලණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
- නිකලස්. සී. ඩබ්., (1961). පුරාණ වාරි මාර්ග ක්‍රම අනුරාධපුර යුගය. ඒ. ලියනගමගේ, ආර්. ගුණවර්ධන. (සංස්.) කැළණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
- ***පූජාවලිය.,*** 1951. (සංස්). බුද්ධදත්ත හිමි, පොල්වත්තේ., කොළඹඃ එම්.ඩී.ගුණසේන සහ සමාගම.
- ***මහාවංසය.,*** 1996. සුමංගල හිමි, බටුවන්තුඩාවේ., දෙවරක්ෂිත පඬි, ඇස්., කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.
- රණවැල්ල, සිරිමල්., 2003. ***රෝහණ දේශයේ ඉතිහාසය.*** රුහුණ විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි.
- ***රසවාහිනී.,*** 1961. සංස්කරණය, ඤාණවිමල හිමි, කිරිඇල්ලේ., කොළඹඃ එම්.ඩී.ගුණසේන සහ සමාගම.
- ***රාජාවලිය.,*** 1997. සංස්කරණය, සුරවීර, ඒ.වී., කොළඹඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය,** (2001). කැළණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
- **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය. II කාණ්ඩය,** (1972). කැළණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
- ***වංසත්ථපාසිනී.,*** 1994. සිංහල අනුවාදය අකුරටියේ අමරවංශ හිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැලණිය විශ්වවිද්‍යාල මුද්‍රණාලය.
- විජයසූරිය, විමල., 1987. ***රුහුණේ අප්‍රකට පුරාවස්තු.*** නුගේගොඩඃ සූර්ය ප්‍රකාශන භාරය.
- සිරිවීර, ඉ. ඩබ්., 2012. *"සාමාජීය විකාශය"* ***ශ්‍රී ලාංකේය ඉතිහාසය.*** 1 වෙළුම, ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග (ප්‍ර. සංස්). ආර්.එම්.එම්. චන්ද්‍රරත්න, චන්දන රෝහණ විතානාච්චි, ආරිය ලගමුව/ ඩී. තුසිත මැන්දිස්, සිරිමල් රණවැල්ල, හඟුරන්කෙත ධීරානන්ද හිමි, බී.ඒ. ටෙනිසන් පෙරේරා, සිරි තිලකසිරි, පී.එල්. ප්‍රේමතිලක, සේනක බණ්ඩාරණායක., (සංස්). කැලණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.
- Brohier, R. L., 1937. **Ancient irrigation works in Ceylon** Colombo: Ceylon Govt. Press,
- Codrington, H.W., 1922. —*NOTES ON CEYLON TOPOGRAPHY IN THE TWELFTH CENTURY˜ Royal Asiatic Society of Sri Lanka (RASSL)*
- ***Epigraphia Zeylanica*** *Vol IV* (1943) Wickramasingha Don Martiono de Silva, London.
- ***EpigraphiaZeylanica*** *Vol V Part I* (1955) Department of Archaeology, Sri Lanka.
- ***EpigraphiaZeylanica*** *Vol VI Part I* (1973) Department of Archaeology, Sri Lanka.
- ***Inscription of Ceylon,*** *Vol I* (1970) Paranavitane, S., Department of Archaeology Ceylon
- ***Inscription of Ceylon,*** Vol II *Part I* (1983) Paranavithana, S. Department of Archaeology.Colombo.
- ***Inscription of Ceylon,*** *Vol II Part II* (2001) Paranavitane, S. (Ed. Dias Malini) Archaeology Survey Department
- ***Inscription of Ceylon,*** *Vol. VII* (2004) Ranawella, S., Department of Archaeology
- Nicholas, C.W., 1963. —*HISTORICAL TOPOGRAPHY OF ANCIENT MEDIEVAL CEYLON˜ Royal Asiatic Society of Sri Lanka (RASSL)*



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk